# තුන්වැනි කොටස

# තුන්වැනි කොටස

## මුදල් මණ්ඩලය විසින් 1998 වර්ෂයේදී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන

**මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ** — පිටුව


1. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීය වෙළෙඳපොළ ගණුදෙනු සඳහා භාණ්ඩාගාර බැඳුම්කර භාවිතය - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/01/98 — i

2. යෙන්.49,997,000/-ජපන්/ශ්‍රී ලංකා විශේෂ ප්‍රදානය (24 වැනි ණය සහන ප්‍රදානය) - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/2/98 — ii

3. ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 5 ක් සඳහා පකිස්ථානු ණය මාලාව- පකිස්ථානු ඉස්ලාමීය ජනරජය සමඟ ඇතිකර ගත් 26.02.1991 දින දරණ ණය ගිවිසුම - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/එස්එෆ්/පීඒකේ/830 — iv

4. යුරෝපීය ඒකීය මුදල හඳුන්වාදීම - "යූරෝ" - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/03/98 — v

5. ශ්‍රී ලංකා මහ බැංකුව සමග භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම් ගණුදෙනු පිළිබඳ මෙහෙයුම් පිළිවෙත් සහ උපදෙස් - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/04/98 — ix

6. ජා.සං.සං. ණය 2938 සීර් බලශක්ති සේවා සැපයුම් ව්‍යාපෘතිය - මෙහෙයුම් උපදෙස් අංක: බීඩී/05/98 — xvi

7. වාණිජ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන් 1998 — xviii

මෙහෙයුම් උපදෙස් අංක : බීඩී/01/98

විවට වෙළෙඳ කටයුතු අංශය,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
30 මහල, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
බටහිර කුළුණ,
ඇචිලන් චතුරශ්‍රය,
කොළඹ 01.
1998 මැයි 20 වැනි දින.

සියලුම ප්‍රාථමික වෙළෙඳුන් සහ
වාණිජ බැංකු වෙත.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීය වෙළෙඳපොළ ගණුදෙනු සඳහා භාණ්ඩාගාර බැඳුම්කර භාවිතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීය වෙළෙඳපළ ගණුදෙනු සඳහා භාණ්ඩාගර බැඳුම්කර පිලිගනු ලබන බව ප්‍රාථමික වෙළෙඳුන් සහ වාණිජ බැංකු වෙත මෙයින් දනුම් දෙමු.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම් සඳහාත්, ද්විතීය වෙළෙඳපලේ පූර්ණ අයිතිය හිමි වන පරිදි මිළදී ගැනීම් හා විකිණීම් සඳහාත් භාණ්ඩාගාර බැඳුම්කර භාවිතා කිරීම 1998 මැයි මස 21 දින සිට ක්‍රියාත්මක වේ. මෙම ගණුදෙනුවලට අදළ මෙහෙයුම් උපදෙස් මෙයට අමුණා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධ ප්‍රති මිළදී ගැනීම් හෝ පූර්ණ අයිතිය හිමි වන පරිදි විකුණුම් කටයුතු සිදු කරනුයේ, ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අනුවය.

භාණ්ඩාගාර බිල්පත් වට්ටම් කිරීම, ප්‍රති වට්ටම් කිරීම හා ප්‍රති මිළදී ගැනීම් සම්බන්ධ දනට පවත්නා උපදෙස් තවදුරටත් අදලව පවතිනු ඇත.

වයි. එම්. ඩබ්ලිව්. බී. වීරසේකර
*වැඩ බලන ප්‍රධාන ගණකාධිකාරී.*

මෙහෙයුම් උපදෙස් අංක : බීඩී/2/98

විදේශීය මුල්‍ය අංශය,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
1998 ජුනි මස 10 වැනි දින.
දුරකථනය: 346287

සියළුම වාණිජ බැංකු වෙත.

## යෙන්.49,997,000/- ජපන්/ශ්‍රී ලංකා විශේෂ ප්‍රදානය (24 වැනි ණය සහන ප්‍රදානය)

1. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජපාන රජය විසින් ලබාදී ඇති ප්‍රදානයන් යටතේ තෝරාගන්නා ලද රටවලින් කැරෙන ආනයනයන් මූල්‍යනය කිරීම සඳහා පහත සඳහන් උපදෙස් වලින් දී ඇති ක්‍රියා පිළිවෙත් අනුගමනය කරන ලෙස වාණිජ බැංකු වලින් ඉල්ලා සිටිනු ලැබේ. මෙම ප්‍රදානය යටතේ ආනයන සඳහා ප්‍රතිපාදනයන් විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

2. සැපයුම්කරු සමඟ ඇතිකරගත් ගිවිසුමේ පිටපතක්ද විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද බලය පැවරීමේ ලිපියක්ද සමඟ ප්‍රතිපාදනයක හිමිකරුවෙකු අයදුම් කළ අවස්ථාවකදී වාණිජ බැංකුවකට සැපයුම්කරුගේ රටෙහි තමාගේ ගණුදෙනුකරුවන්ගේ මාර්ගයෙන් සැපයුම්කරු වෙනුවෙන් මෙම පහසුකම යටතේ අවලංගු කළ නොහැකි ණයවර ලිපියක් විවෘත කළහැකිය. එවන් සෑම ණයවර ලිපියකම අනුක්‍රමික අංකයට මුලින් පිළිවෙලින් ආරම්භක බැංකුවේ හඳුනාගැනීමේ අංකය සහ '1 වැනි යෙන් ප්‍රදානය 1998' යන්න යොදා තිබිය යුතුය.

3. ජපානයේ, ටෝකියෝවෙහි සීමාසහිත ටෝකියෝ – මිට්සුබිෂි බැංකුවෙහි ජාත්‍යන්තර සේවා බැංකු කටයුතු අංශය වෙතැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ අංක: 3076706 දරණ යෙන් සාමාන්‍ය තැන්පතු ගිණුම හර කිරීමෙන් ගණුදෙනුකාර බැංකුව විසින් ප්‍රතිපූරණය ලබාගතයුතු බව සෑම ණයවර ලිපියකම සඳහන් විය යුතුය. ලියකියවිලි ණයවර ලිපියේ නියමයනට එකඟවන බවටත්, එම ලියකියවිලි ණය විවෘත කරන බැංකුව වෙත යවා ඇති බවටත්, ගණුදෙනුකාර බැංකුවෙන් ලබාගත් සහතිකයක් සමඟ ප්‍රතිපූරණය ඉල්ලා සිටිය යුතුය. ණයවර ලිපිය විවෘත කළ වහාම ණය විවෘත කරන බැංකුව විසින් සෑම ණයවර ලිපියකම පිටපත් දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරී විසින් ණය සම්බන්ධයෙන් වූ ප්‍රතිපූරණ අවසර ලිපියක් ටෝකියෝවෙහි සීමාසහිත ටෝකියෝ මිට්සුබිෂි බැංකුව වෙත නිකුත් කරනු ලැබේ. මෙම ලිපිය නොමැතිව ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය කිරීම සිදු කරනු නොලැබේ.

4. ගණුදෙනුකාර බැකුවෙන් ලියකියවිලි ලැබුණු විට ණය විවෘත කරන බැංකුව ඒවා ආනයනකරු වෙත මුදාහැරිය යුත්තේ එම ලියකියවිලි වල රුපියල් වටිනාකම ලබා ගැනීමෙන් පසුව පමණකි. එම ලියකියවිලි ආනයනකරු වෙත මුදාහැරීමට පෙර ලියකියවිලිවල මුළු වටිනාකම ලබාගත් බවට වාණිජ බැංකු තහවුරු කරගත යුතුය. අදාළ බැංකුව වෙත ලියකියවිලි ලැබී ඇති බවට උපදෙස් ලැබී දින 10 ක් ඇතුලතදී ආනයනකරු විසින් ගෙවීම් කළයුතුය.

5. නිශ්චිත කාලය වන දින 10 තුළදී ලියකියවිලිවල වටිනාකම ගෙවීමට ආනයනකරු අපොහොසත් වුවහොත් බැංකුව වෙත ලියකියවිලි ලැබුණු බවට උපදෙස් ලැබූ දින සිට බිල ගෙවා අවසන් කරන දිනය තෙක් බැංකු අනුපාතිකය සියයට 3 කින් ඉක්මවූ පොලියක් ගෙවීමට ආනයනකරුට සිදුවනු ඇත.

6. වාණිජ බැංකුව ආනයනකරු වෙතින් ලියකියවිලි වල රුපියල් වටිනාකම ලබාගෙන මහ බැංකුව වෙත ගෙවීමේදී මෙම මෙහෙයුම් උපදෙස්වල යොමුව සඳහන් කරමින් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුයි.

(අ) ආනයනකරුගේ නම සහ ලිපිනය :-

(ආ) ණයවර ලිපියේ අංකය :-

(ඇ) අපනයන කරුගේ නම :-

(ඈ) යෙන්වල සමානුපාතිකය (ලියකියවිලිවල වටිනාකම වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් දක්වා ඇති අවස්ථාවන්හිදී) ;

(ඉ) බලපාන විනිමය අනුපාතිකය( ණයවර ලිපියෙහි දක්වෙන ව්‍යවහාර මුදල් වර්ගය පරිවර්තනය කෙරුන ජපන් යෙන් අනුපාතිකයද ඇතුළුව) ;

(ඊ) ලියකියවිලි ලැබුණු දිනය ;

(උ) ආනයනකරු වෙත දන්වූ දිනය ;

(ඌ) ආනයනකරු විසින් ගෙවීම් කරන ලද දිනය ;

7. ගෙවීම් කරන විට ගෙවීම් කරනු ලබන නැව්ගත කිරීමට අදළ පහත සඳහන් සෑම ලියවිල්ලකම පිටපතක් අමුණා එවීමට වාණිජ බැංකු වගබලාගත යුතුය.

(i) ඉන්වොයිසිය ;

(ii) නෞභාර පත්‍රය/ගුවන් බලපත්‍රය ;

(iii) සැපයුම්කරු වෙත මුදල් ගෙවන ලද දිනය හා ගෙවූ ප්‍රමාණයට සාක්ෂි දරණ ලියකියවිලි

**වයි. එම්. ඩබ්ලිව්. බී. වීරසේකර**
වැඩබලන ප්‍රධාන ගණකාධිකාරී

පිටපත් :

1. විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

2. විනිමය පාලක

මගේ අංකය : බීඩී/එල්එල්/පීජ්කේ/830.

විදේශ මුදල් අංශය,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
1998 ජුනි 18 වැනි දින.

මහජන බැංකුව,
ජාත්‍යන්තර ශාඛාව වෙත.

**ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 5 ක් සඳහා**
**පකිස්ථානු ණය මාලාව-පකිස්ථානු ඉස්ලාමීය ජනරජය සමග ඇති කරගත්**
**26.02.1991 දින දරණ ණය ගිවිසුම**

1. යොමුව :- 1991 දෙසැම්බර් 19 වැනි දින හා අංක.බීඩී/15/91 දරණ ඉහත කරුණු සම්බන්ධ අපගේ මෙහෙයුම් උපදෙස් පත්‍රිකාව සම්බන්ධවයි.

2. ඉහත ණය වලංගු කාලය පකිස්ථාන් රජය විසින් 2000 ජනවාරි 15 දින දක්වා දීර්ඝ කර ඇති බව ද දන්වනු කැමැත්තෙමු. තවද, මෙහෙයුම් උපදෙස් හි ඇමුණුම් අංක.1 හි දක්වෙන ගෙවීම් සඳහා සුදුසුකම් ලත් ආයාත ලැයිස්තුවට ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා 40 බීසීජීඑස් වැගන් ද ඇතුළත් වේ.

3. 1991 දෙසැම්බර් මස 19 වැනි දින හා අංක.බීඩී/15/91 දරණ අපගේ මෙහෙයුම් උපදෙස් හි අඩංගු අනෙකුත් නියමයන් හා කොන්දේසි තවදුරටත් නොවෙනස්ව බලපැවැත්වෙනු ඇත.

**එම්. බී. දිසානායක**
ප්‍රධාන ගණකාධිකාරී

පිටපත් :
1. විනිමය පාලක.
2. අධ්‍යක්ෂ ජනරාල්,
   විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

මෙහෙයුම් උපදෙස් අංක : බීඩී/03/98

යොමු අංක : බීඩී/එෆ්සීබීඑස්/1/98
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 590,
කොළඹ.

යොමු අංක : ඊසී/03/98(ඩී)
විනිමය පාලන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ.පෙ. 883,
කොළඹ.
1998.11.12 වැනි දින.

**වාණිජ බැංකු සඳහා මෙහෙයුම් උපදෙස්**

## යුරෝපීය ඒකීය මුදල හඳුන්වා දීම - "යුරෝ"

1999.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි "යුරෝ" නමින් හැඳින්වෙන මුදල් ඒකකයක් තම සාමාජික රටවලට හඳුන්වා දීමට යුරෝපීය සංගමය තීරණය කර ඇත. මෙදින සිට සහභාගී වන රටවල දැනට පවතින ජාතික ව්‍යවහාර මුදල් නව ව්‍යවහාර මුදලට පරිවර්තනය කරන විනිමය අනුපාත වෙනස් කළ නොහැකි ලෙස ස්ථාවරව තැබීමට බලාපොරොත්තු වේ. ඔස්ට්‍රියාව, බෙල්ජියම, පින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය, ඉතාලිය, ලක්සෙම්බර්ග්, නෙදර්ලන්තය, පෘතුගාලය සහ ස්පාඤ්ඤය යන රටවල් එකොළහ ඔවුන්ගේ ජාතික ව්‍යවහාර මුදල් වෙනුවෙන් යෝජිත ව්‍යවහාර මුදල භාවිතා කිරීමට එකඟ වී ඇත. 1999.01.01 දින සිට 2001.12.31 දින දක්වා වන පරිවර්තන කාලය තුළදී "යුරෝ" ව්‍යවහාර මුදල එකී සහභාගී වන සාමාජික රටවල්වල ජාතික ව්‍යවහාර මුදල් සමඟ එක්ව භාවිතා වනු ඇත. 2002.01.01 දින සිට එකී ජාතික ව්‍යවහාර මුදල්වල පැවැත්ම නවතිනු ඇත.

2. "යුරෝ" හඳුන්වා දෙන විට 1999.01.01 සිට අලුත් මුදලින් වාණිජ බැංකුවල සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඇති හැකියාව සහතික කරනු වස් සිය ව්‍යාපාර කටයුතු සකස් කර ගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමු. ගණුදෙනු, මාරු කිරීම, නැවත වෙනත් මුදලකින් ප්‍රකාශ කිරීම, ගෙවීම් ක්‍රමය, මිල මූලයන් හා ගිවිසුම්වල අඛණ්ඩතාව ආදියේ ඇති වන සමහර වැදගත් ප්‍රතිවිපාක පරීක්ෂාවට ලක් කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් අන්තර් ජාතික වාණිජ මණ්ඩලය (ICC) විසින් නිකුත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටපතක් මීට අමුණා ඇත. යුරෝ හඳුන්වා දීම නිසා ඇති වන ජාත්‍යන්තර වශයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව මෙම ප්‍රකාශනයේ අඩංගු උපදෙස් මෙන් ම ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය විසින් වරින්වර නිකුත් කෙරෙන ප්‍රකාශනයන්හි දක්වෙන උපදෙස් ඉතා පරීක්ෂාකාරීව අනුගමනය කරන මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

3. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුවේ විරුද්ධත්වයක් නැති බව සියලුම වාණිජ බැංකුවලට දන්වා සිටී.

(අ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවලට 1999.01.01 දින සිට ගෙවීම් හෝ ලැබීම් හෝ සඳහා යුරෝ මුදලින් (Nostro ) ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම.

(ආ) අපගේ 79.05.02 දින දරන FCBS 1/79, 78.03.01 දින දරන BC/F 922/77 චක්‍රලේඛන සහ 88.05.05 දිනරන EC/08/88(D), 90.03.30 දින දරන EC/22/90(D), 80.05.14 දින දරන EC/19/80(D), 91.08.01 දිනදරන EC/52/91(D) සහ 93.03.29 දින දරන EC/41/93(D) මෙහෙයුම් උපදෙස්වල සඳහන් කටයුතු සඳහා විදේශ මුදල් බැංකුඒකක (FCBU ), අනේවාසික විදේශ මුදල් (NRFC) ගිණුම්, නේවාසික විජාතික විදේශ මුදල (RNNFC) ගිණුම්, නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්, ආනයන කරුවන්ගේ විදේශ මුදල් (EFC) ගිණුම් සඳහා 1999.01.01 දින සිට යුරෝ විදේශීය මුදලක් ලෙස නම් කිරීම.

4. ඉහත සඳහන් කරන ලද සාමාජික රටවල ජාතික ව්‍යවහාර මුදල් වලින් හෝ යුරෝ මුදලින් ඔවුන්ගේ ගණුදෙනු කරුවන් සමඟ එළඹෙන ගිවිසුම් අනුව කටයුතු කිරීමට සහ අදාල ගිණුම් පවත්වාගෙන යාම ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාණිජ බැංකු පූර්ණ වගකීම භාර ගතයුතු අතර, යුරෝ හෝ සමාජික රටවල ජාතික ව්‍යවහාර මුදල් වලින් හෝ කෙරෙන යම් ගණුදෙනුවක් වේ නම් දැනට වාර්තා කරන ආකෘතිවල ඒ පිළිබඳ විස්තර ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම් දිය යුතුය.

**එම්. බී. දිසානායක**
*ප්‍රධාන ගණකාධිකාරී.*

**එම්. ආර්. ප්‍රනාන්දු**
*විනිමය පාලක*

# ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය

## ලෝක වෙළෙඳ සංවිධානය

## ප්‍රතිපත්ති ප්‍රකාශනය

**යුරෝපීය ආර්ථික සහ මූල්‍යමය හවුල ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නීතිරීතිවලට සම්බන්ධ ගණුදෙනුවල මූල්‍යමය බැඳුම් කෙරෙහි ඇති කරවන බලපෑම්.**

**බැංකු තාක්ෂණය සහ ප්‍රායෝගිකත්වය පිළිබඳ කොමිසම විසින් පිළියෙල කරන ලදී.**

ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (ජා.වා.ම.) පැරිස් නගරය මූලස්ථානය කර ගත් ජගත් ව්‍යාපාරික ආයතනයකි. බැංකු තාක්ෂණය හා ක්‍රියාමාර්ග, ජාත්‍යන්තර වාණිජ ක්‍රියාමාර්ග හා රක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ කමිටු මගින්, ජාත්‍යන්තර වෙළෙඳමට අදල ගිවිසුම් ඇපකර සම්බන්ධ ඒකීය නීතිරීති ද ඇතුළත්ව (URCG 325), ඉල්ලුම් ඇපකර සඳහා ඒකීය නීති (URDG 458), සලේඛන ලිපි සඳහා පිළිපැදිය යුතු ඒකීය නීතිරීති හා ක්‍රියාමාර්ග (UCP 500), එක්රැස් කිරීම සඳහා ඒකීය නීති (URC 522), ගිවිසුම් බැඳුම්කර සඳහා ඒකීය නීති (URCB 524), බැංකු අතර ප්‍රතිපූරණ සඳහා ඒකීය නීති (URR 525) සම්බන්ධව පිළිගත් නීතිරීති සකස් කර පවත්වාගෙන යනු ලැබේ. මෙම ප්‍රකාශනයෙහි මින් මතුවට ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නීති ඒකාබද්ධව " ජා.වා.ම." නීති යනුවෙන් සඳහන් කරනු ලැබේ.

යුරෝපයේ ඒකීය මුදල ලෙස යුරෝ මුදල හඳුන්වා දීමෙන් ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නීතිරීති බලපවත්වන කිසිම ලියකියවිල්ලක වෙනස් කිරීමක්, ලිහිල් කිරීමක්, මග හැරීමක් වැනි බලපෑමක් ඇති නොවේ. ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ නීති නිවැරදි ලෙස නිර්වචනය කර, අනුගමනය කරන ලෙස මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අවධාරණය කරනු ලැබේ. තවද, ජා.වා.ම. යේ නීතිරීතිවලට අනුකූලව නිකුත් කරන ලද උපකරණ කිසිම බාධාවකින් තොරව ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමට හැකිවන පිණිස මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය හැකිතාක් පුළුල් ලෙස බෙදා හරින මෙන් ජාත්‍යන්තර වෙළෙඳ මණ්ඩලයේ ජාතික කමිටු සහ සම්බන්ධිත ආයතන තරයේ ඉල්ලා සිටිනු ලැබේ. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය ජා.වා.ම.යේ නීතිරීතිවල අන්තර්ගත කිසිදු වගන්තියක වෙනසක් සිදු නොකරන අතර, එ මගින් හුදෙක් නිවැරදි අර්ථකථනයක් පමණක් කරනු ලැබේ.

**1. සාමාන්‍ය**

1.1 යුරෝ මුදල 1998 මැයි මස නම් කිරීමට නියමිත යුරෝපා සංගමයේ යුරෝපීය ආර්ථික හා මූල්‍යමය හවුලට සහභාගී වන, (මින්පසු යුරෝපා මූල්‍යමය හවුලට සහභාගී වන රටවල් ලෙස හඳුන්වනු ලබන) රටවල්වල දේශීය මුදල්වලට 1999.01.01 දින සිට ආදේශකයක් බවට පත් වේ. 1999.01.01 දින යුරෝපීය හවුලේ පාලන මණ්ඩලය මගින් වෙනස් කළ නොහැකි ලෙසට ස්ථාවරව තීරණය කරනු ලබන පරිවර්තන අනුපාත මත ("පරිවර්තන අනුපාත") යුරෝ මුදල (1 යුරෝ = 100 සත) යුරෝපීය මූල්‍යමය හවුලට සහභාගී වන රටවල්වල දේශීය මුදල්වලට බෙදනු ලැබේ. 1999.01.01 සිට 2001.12.31 දක්වා වන පරිවර්තන කාලය තුළ එකී අනුපාතයන් බලපැවැත්වේ. ජාතික සංඥපිත මුදල් යන්න මෙහි පහත දක්වා ඇත්තේ යුරෝපා මූල්‍ය හවුලට සහභාගී වන ඕනෑම රටක 1999.01.01 දිනට ප්‍රථම භාවිතා වූ ව්‍යවහාර මුදල් වර්ග ය.

පරිවර්තන කාලයේ දී පුද්ගලයන්ට යුරෝ හෝ ජාතික මුදල් පාවිච්චි කිරීමේ නිදහස තිබේ. එහෙත් ගෙවීම් කිරීම හෝ මුදල් ලබා ගැනීම යුරෝ වලින් කරන ලෙසට (එලෙස එකඟ වී නැත්නම්) බැඳීමක් නොමැත. කෙසේ වුවද, යුරෝ හෝ ජාතික මුදලින් ප්‍රකාශිත, සහභාගී වන රටක් තුළ දී ගෙවීමට නියමිත ඕනෑම මුදල් ප්‍රමාණයක් එරට තුළ දී ණය හිමියගේ ගිණුමට, යුරෝ වලින් හෝ නියමිත පරිවර්තන අනුපාතයෙන් පරිවර්තනය කරන ලද ජාතික මුදලින් හෝ ගෙවීමට ණයකරුට හැකියාව ඇත.

1999.01.01 දින සිට යුරෝපීය මුදල් ඒකකය වෙනුවට යුරෝ මුදල් එකට එකේ අනුපාතයට ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබේ.

1.2 2002.01.01 දින සිට ජාතික මුදල් අහෝසි වන අතර යුරෝපීය මූල්‍යමය හවුලට සහභාගී වන රටවල්වල නීතිමය වශයෙන් වලංගු එකම මුදල් ඒකකය වනුයේ යුරෝ පමණකි. එද සිට සියලුම ගෙවීම් යුරෝ වලින් කළයුතු වේ.

1.3 යුරෝ හඳුන්වා දීම නිසා ගිවිසුම්වල අඛණ්ඩතාවයට හානියක් සිදු නොවේ.

1.4 ජාතික මුදල්වලට බලපවත්නා ඉහත සඳහන් මූලික කරුණු යුරෝපා සංගමයේ සියලු සාමාජික රටවල නීතිමය බැඳීමක් වන අතර, සාමාන්‍යයෙන් පිළිගත් නීතිමය සිද්ධාන්ත අනුව රටක නීතිමය වශයෙන් වලංගු මුදල් එම මුදල සම්බන්ධ කාරණයකදී ඒ රට තුළ පවත්නා නීතිය අනුව පාලනය වන නිසා ජාතික මුදල් වලින් කළයුතු ගෙවීමක් කිරීමේ දී යුරෝපීය සංගමයෙන් පිටස්තර පුද්ගලයන්ට වුවද එකී මූලධර්ම සමානව අදාල වෙනු ඇත.

## 2. විවිධ ජා.වා.ම. නීති යටතේ යුරෝ ප්‍රායෝගිව හඳුන්වා දීමේ ප්‍රතිවිපාක

2.1 සලේඛන ණය සඳහා UCP 500 (සුදනම් ණයවර ලිපි ඇතුළත්ව) නිර්වචනය කිරීම අවශ්‍යතා ඇති විය හැකි විවිධ අවස්ථා සහ අදල නීති අර්ථකථනයන් පහත දක්වේ.

2.1.1 ජාතික මුදලින් නිකුත් කරන ලදුව, 1999.01.01 දිනට පෙර ගෙවිය යුතු සලේඛන ණය:- ගෙවීම් කිරීම සහ ලියකියවිලි ණය මුදලට අදල මුදලින් විය යුතු ය.

2.1.2 1999.01.01. දිනට ප්‍රථම නිකුත් කරන ලදුව 2002.01.01 දිනට ප්‍රථම ජාතික මුදලින් ගෙවිය යුතු සලේඛන ණය:- ලිපියේ සඳහන් මුදලින් හෝ එහි යුරෝ සමකයෙන් ලියකියවිලි ඉදිරිපත් කළ හැකිය. එසේ වුවද, ගෙවීම් කිරීම යුරෝපීය මූල්‍යමය හවුලේ සහභාගී වන රටක මුදලින් කළයුතු විට සහ එවැනි සාමාජික රටක ඇති ගිණුමක් බැර කළයුතු විට ණය ගැතියාගේ අභිමතය පරිදි (උදහරණ: නිකුත් කළ බැංකුවේ) යුරෝ සමකය ගෙවිය හැකිය.

2.1.3 99.01.01 දිනට පෙර ජාතික මුදලින් නිකුත් කරන ලදුව හා 2002.01.01 දින හෝ ඉන්පසුව ගෙවිය යුතු සලේඛන ණය:- ගෙවීම යුරෝ මඟින් සිදු කළ යුතු ය. එහෙත් ඒ හා සම්බන්ධ (1999.01.01 දින හෝ ඉන් පසුව නිකුත් කළ) ලියවිලි ණය ලබා ගත් මුදලින් හෝ යුරෝ සමකයෙන් ඉදිරිපත් කළ හැකිය. 2002.01.01 දින හෝ ඊට පසු නිකුත් කරන ලද ලියවිලි, යුරෝ වලින් සඳහන් කර නිකුත් කළ යුතුය.

2.1.4 1999.01.01 දින හෝ ඊට පසු එහෙත් 2002.01.01 දිනට පෙර නිකුත් කරන ලද හා ගෙවිය යුතු යුරෝ වලින් හෝ ඒ ඒ රටෙහි ජාතික මුදලින් ඇති සලේඛන ණය:- ගෙවීම ණය ලබා ගත් මුදලින්ම කළ යුතු ය. එහෙත් ඒ හා සම්බන්ධිත ලියවිලි ණය ලබා ගත් මුදලින් හෝ යුරෝ සමකයෙන් හෝ අයලාභියාගේ ව්‍යාපාරික ස්ථානයේ ජාතික මුදල්වලට සමාන අගයකින් යුත් මුදල් වලින් කළ හැකි ය. කෙසේ වෙතත් ණය ලබා ගත් මුදල ජාතික මුදල් ඒකකයෙන් ඇති විට හා ගෙවීම යුරෝපා සංගමය තුළ රටක, මුදලින් එම රට තුළ ඇති ගිණුමක් බැර කර සිදු කරන විට, ගෙවීම ණය ගැතියාගේ (නිකුත් කරන ලද බැංකුවේ) අභිමතය පරිදි යුරෝ වලින් සිදු කළ යුතුය.

2.1.5 1999 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව එහෙත් වර්ෂ 2002 ජනවාරි 01 වන දිනට ප්‍රථම ජාතික මුදලින් හෝ යුරෝ මුදලින් නිකුත් කරන ලදුව 2002.01.01 දිනට හෝ ඊට පසුව ගෙවීම් කළයුතු සලේඛන ණය:- ගෙවීම් යුරෝ මුදලින් කළ යුතුය. එහෙත් සියලු ලියකියවිලි ණය ලබා ගන්නා ලද මුදල් වර්ගයෙන් හෝ යුරෝ මුදලින් හෝ අයලාභියාගේ ව්‍යාපාරය පිහිටි රටට අදල ව්‍යවහාර මුදලින් ඉදිරිපත් කළ හැකිය. වර්ෂ 2002 ජනවාරි 01 වනදට පසුව නිකුත් කරනු ලබන සියලුම ලියකියවිලි යුරෝ වලින් පමණක් විය යුතුය.

2.1.6 එහෙත් ලියකියවිලි එකවර ඉදිරිපත් කරන අවස්ථාවක දී කිසියම් ලියවිල්ලක් ණය මුදලට අදල ලිපියේ සඳහන් මුදල් වර්ගයෙන් සහ/හෝ යුරෝ මුදලින් හෝ ණයලාභියාගේ ව්‍යාපාරය පිහිටි රටට අදල මුදල් වර්ගයෙන් හෝ දක්වේ නම් ඉහත 2, 3, 4 හා 5 උදහරණ වලින් දක්වන ලද කාර්යයන් සඳහා වන ලියකියවිලි (UCP ආකෘති 34 F හි සඳහන් රක්ෂණ ලියකියවිලි ද ඇතුළුව) එකිනෙකට නොගැලපෙන ඒවා ලෙස නොසැලකෙයි.

2.1.7 වර්ෂ 2002 ජනවාරි 01 වන දින හෝ/ඊට පසුව නිකුත් කළ හා ගෙවිය යුතු, සලේඛන ණය:- ජාතික මුදල් වලින් ණය නිකුත් කළ නොහැකි ය. යුරෝ වලින් පමණක් නිකුත් කළ යුතු ය. ගෙවීම් සහ (වර්ෂ 2002 ජනවාරි 01 වන දිනට හෝ පසුව නිකුත් කළ) ලියකියවිලි යුරෝ වලින් කළ යුතු ය.

2.1.8 මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දක්වන ලද පැහැදිලි කිරීම් පැවරුම් ණය සඳහා ද එක ලෙස අදාල වේ. පරිවර්තන කාලයේ දී පැවරිය යුතු ජාතික මුදල් වටිනාකම් වලින් නම් කර ඇති පැවරිය හැකි ණය - පැවරුම් බැංකුව විසින් මුදල් වර්ගය හා ලේඛනගත මුදල යුරෝ සම අනුපාතිකයට අනුව පරිවර්තනය කරනු ඇත.

2.2 URCG 325/URDG 458/URCB 524 - ඇප හා බැඳුම්කර:

ඉහතින් දක්වා ඇති මූලධර්ම ඇප හා බැඳුම්කරවලට ද අදාල වේ.

2.3 URC 522 රැස් කිරීම්:

රැස් කිරීම් සම්බන්ධ උපදෙස්වල සඳහන් මුදල් වර්ගයෙන් රැස් කිරීම් කළ යුතුය. කෙසේ වෙතත්, යුරෝපා මූල්‍ය සංගමයට අයත් රටක ජාතික මුදලින් 1999 ජනවාරි 01 වන දින සිට රැස් කිරීමේ උපදෙස් දක්වේ නම් යුරෝ සමානුපාතිකයට අනුව ගෙවීම් කළ හැකිය. වර්ෂ 2002 ජනවාරි 01 වන දින සිට ගෙවීම් හා භාර ගැනීම් යුරෝ සමානුපාතිකයට අනුවම කළ යුතුය.

2.4 URR 525 බැංකු අතර ප්‍රතිපූරණය:

ප්‍රතිපූරණ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ හා ගරු කළ යුතු වන්නේ අදල ප්‍රතිපූරණය අනුමත හා අනුග්‍රහය දක්වන ලද මුදල් වර්ගයෙනි. කෙසේ වෙතත්, එම මුදල් වර්ග යුරෝපා මූල්‍ය සංගමයේ සාමාජික රාජ්‍යයක ජාතික මුදලින් නම් කර ඇත්තේ නම් වර්ෂ 1999 ජනවාරි 01 වන දින සිට එම කටයුතු කිරීම හා ගරු කිරීම යුරෝ සමානුපාතිකයෙන් කළ හැකි අතර, වර්ෂ 2002 ජනවාරි 01 වන දින සිට නම් එම කටයුතු කිරීම හා ගරු කිරීම යුරෝ සමානුපාතිකයෙන් කළ යුතුය.

ලේඛන අංක : 470/822
1998 මාර්තු 04 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක : බීඩී/04/98

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
30 මහල, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
බටහිර කුළුණ,
ඇචිලන් චතුරශ්‍රය,
කොළඹ 01.
1998 නොවැම්බර් 06 වැනි දින.

භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රාථමික
වෙළෙඳුන් සහ සියලුම වාණිජ බැංකු වෙත.

**ශ්‍රී ලංකා මහ බැංකුව සමග භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර**
**ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම් ගණුදෙනු පිළිබඳ**
**මෙහෙයුම් පිළිවෙත් සහ උපදෙස්**

1. ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධයෙන් ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම් ගණුදෙනු 1998 නොවැම්බර් මස 09 දින සිට බලපවත්වන පරිදි නැවත අරඹන බව සියළුම වාණිජ බැංකු හා ප්‍රාථමික ගණුදෙනු කරුවන් වෙත මෙයින් දනුම් දෙමු. යෝජිත ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනු සම්බන්ධිත මෙහෙයුම් පිළිවෙත් සහ උපදෙස් මේ සමඟ අමුණා ඇත.

2. ශ්‍රී ලංකා මහ බැංකුව සමග ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවල යෙදීම සඳහා ප්‍රාථමික වෙළෙඳුන් සහ වාණිජ බැංකු වෙනුවෙන් ඔබ ආයතනයේ බලය ලත් නිලධාරීන්ගේ නම් සහ තනතුරු ඔවුන්ගේ දුරකථන සහ ෆැක්ස් අංක සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ විවිට වෙළෙඳ කටයුතු අංශයට දනුම් දෙන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

3. මෙම ක්‍රමය පිළිබඳ වැඩිදුර විස්තර පහත සඳහන් නිලධාරී මහත්වරුන්ගෙන් ලබාගත හැක.

   වයි. එම්. ඩබ්. බී. වීරසේකර මහතා
   අතිරේක ප්‍රධාන ගණකාධිකාරී
   දුරකථන 346311

   ඒ. කමලසිරි මහතා
   නියෝජ්‍ය ප්‍රධාන ගණකාධිකාරී
   දුරකථන 346298

4. ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්විතීය වෙළෙඳපල, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රති වට්ටම් කිරීම්, වට්ටම් කිරීම් හා ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම් සම්බන්ධ දනට පවතින උපදෙස් තවදුරටත් අදාලව පවතිනු ඇත.

5. මෙහෙයුම් පිළිවෙත්, උපදෙස් හෝ කොන්දේසි, වෙනස් කිරීම, ඉවත් කිරීම හෝ කිසිදු හේතුවක් නොදක්වා මෙම පහසුකම සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

**වයි. එම්. ඩබ්ලිව්. බී. වීරසේකර**
වැඩ බලන ගණකාධිකාරී

**ඒ. එස්. ජයවර්ධන**
*අධිපති*

# ශ්‍රී ලංකා මහ බැංකුවේ
# ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීමේ පහසුකම (ප්‍ර.ප්‍ර.මී.ගැ.ප.)
# මෙහෙයුම් පිළිවෙත් සහ උපදෙස්

මෙහි සඳහන් මෙහෙයුම් පිළිවෙත් හා උපදෙස්වල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස නැතිනම්

"බැංකු පනත" යනුවෙන් අදහස් කරනුයේ 1988 අංක 30 දරණ කලින් කලට සංශෝධනය කරන ලද බැංකු පනතයි.

"වැඩ කරන දිනය" ලෙස දක්වා ඇත්තේ බැංකු නිවාඩු නොවන වෙනත් ඕනෑම දිනයකි.

"ශ්‍රී ලංකා මහ බැංකුව" යනුවෙන් අදහස් කරනුයේ මුදල් නීති පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුවයි.

"අවසර ලත් වාණිජ බැංකුව" යන්නෙහි අර්ථය බැංකු පනතේ ඇති අර්ථයට සමානය.

" මුදල් නීති පනත" යන්නෙහි අර්ථය කලින් කලට සංශෝධනය කළ මුදල් නීති පනතයි (ලංකා නීති ප්‍රඥප්තියේ 422 පරිච්ඡේදය)

"පූර්ණ අයිතිය හිමි වන පරිදි මිළදී ගැනීම" යනු මහ බැංකුව විසින් සුරැකුම්පත් කොන්දේසි විරහිතව මිළදී ගැනීමයි.

"සහභාගිත්ව ආයතනය" යනුවෙන් අදහස් කරනුයේ බලය ලත් (අවසර ලත්) වෙළෙඳ බැංකුවක් හෝ ප්‍රාථමික ගණුදෙනු කරුවෙකි.

" ප්‍රාථමික වෙළෙන්දකු" යනුවෙන් අදහස් කරනුයේ ප්‍රාථමික වෙළෙන්දකු ලෙස මුදල් නීති පනතේ දක්වා ඇති අයෙකි.

"ගැණුම් වටිනාකම" යනුවෙන් අදහස් කරනුයේ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනු සඳහා ඉදිරිපත් කල සියලුම සුරැකුම්පත්වල ගැණුම් මිළෙහි මුළු එකතුවයි.

"ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවක්" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනයකින්, නියම කර ගත් දිනකදී, නියම කර ගත් මිළකට හෝ ඵලදායිතා අනුපාතයකට ආපසු විකිණීම් ගිවිසුමකට යටත්ව සුරැකුම්පත් මිළදී ගැනීමයි.

" සුරැකුම්පතක්" යනුවෙන් අදහස් කරනුයේ භාණ්ඩාගාර බිල්පතක් හෝ භාණ්ඩාගාර බැඳුම්කරයකි.

"ආපසු විකිණීමේ වටිනාකම" යනුවෙන් අදහස් කරනුයේ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවකට අදල සියලුම සුරැකුම්පත්වල ආපසු විකුණන මිළ ගණන්හි මුළු එකතුවයි.

"භාණ්ඩාගාර බිල්පතක්" යනුවෙන් අදහස් කරනුයේ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතට අනුව නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පතකි (ලංකා නීති ප්‍රඥප්තියේ 319 පරිච්ඡේදය).

" භාණ්ඩාගාර බැඳුම්කරය" යනුවෙන් අදහස් කරනුයේ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කරයකි (ලංකා නීති ප්‍රඥප්තියේ 320 පරිච්ඡේදය).

වැඩ කරන කාලසීමාව යනුවෙන් අදහස් කරනුයේ ව්‍යාපාරික කටයුතු කරනු ලබන දිනයක 0800 පැයේ සිට 1615 පැය අතර කාලසීමාවයි.

මෙහි සඳහන් ඒක වචන සඳහා බහු වචනද, බහු වචන සඳහා ඒක වචනද ඇතුළත් කළහැක.

1. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවලට අදළ මෙහෙයුම් පිළිවෙත් හා උපදේසවලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් කටයුත්තක නිරත වීම තුළින් මෙම පහසුකම් ලබා ගැනීමේ හැකියාව සහභාගිත්ව ආයතනයක් සතුව පවතී.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් පහසුකම ලබා ගැනීමට අපේක්ෂා කරන සහභාගිත්ව ආයතනය, මේ සම්බන්ධව මෙයෙහුම් පිළිවෙත් හා උපදෙස් පිළි ගන්නා බව ලිඛිතව දැනුම් දිය යුතු අතර, එම ආයතනය වෙනුවෙන් ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවල නිරත වීම සහ අත්සන් යෙදීම සඳහා බලය ලත් නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ අත්සන්ද ආයතනයේ ලිපිනය, දුරකථන, ටෙලෙක්ස් හා ෆැක්ස් අංකද ඇතුළත් කර අමුණා ඇති ආකෘති පත්‍ර 1 සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම්වලට අදළ පොළී අනුපාතය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන අතර, එය රොයිටර් තිරය මගින් වරින් වර ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

4. සහභාගිත්ව ආයතනයට ලිඛිතව දැනුම් දීමක් නොමැති නම් ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් සඳහා වූ කාලපරිච්ඡේදය එක් දිනක් පමණක් වේ.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නියම කරන පරිදි සුරැකුම්පත් ප්‍රති වට්ටම් කරනු ලබන මිලටම ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනු සඳහා අදල සුරැකුම්පත් මිළදී ගැනුමද සිදු කෙරේ.

6. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවල ආපසු විකුණුම් මිළ වන්නේ 5 ජේදයේ සඳහන් කර ඇති පරිදි එම සුරැකුම්පත්වල ගැණුම් මිලට අදල කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද 3 ජේදයෙහි දක්වා ඇති පොළී අනුපාතයට අනුව එහි පොළිය එකතු කලවිට ලැබෙන මිලයි.

7. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවල නිරත වීමට අපේක්ෂා කරන සහභාගිත්ව ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළෙඳ කටයුතු අංශයට ඒ බව දුරකථන අංක 423914, 422094 හෝ ඉදිරියේදී දැනුම් දෙනු ලබන වෙනත් එවැනි දුරකථන අංක මගින් සතියේ වැඩ කරන දිනවල 0900 - 1400 අතර කාලය තුළ පහත සඳහන් විස්තර සමඟ දැනුම් දිය යුතුය.

   (අ) සහභාගිත්ව ආයතනය ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් මගින් ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදල් ප්‍රමාණය.

   (ආ) ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම, අනුක්‍රමික අංකය සහ කල් පිරීමේ දිනය.

   (ඇ) සුරැකුම්පත භාණ්ඩාගාර බැඳුම්කරයක් නම් කූපන් පොළී අනුපාතය.

   දුරකථන මගින් කරනු ලබන දැනුම් දීමෙන් පසුව විනාඩි 30 කාලයක් ඇතුළත ඉදිරිපත් කළ ඉල්ලීම පිළිබඳ ස්ථිර භාවය ලිඛිතව ෆැක්ස් හෝ ටෙලෙක්ස් මගින් තහවුරු වන පරිදි පහත සඳහන් ෆැක්ස් හා ටෙලෙක්ස් අංක වෙත එවිය යුතුය.

   | | |
   |---|---|
   | ෆැක්ස් | 421192, 421194, 421195, 421198 |
   | ටෙලෙක්ස් | 23505, 23506 |

   සහභාගිත්ව ආයතනයට ෆැක්ස් හෝ ටෙලෙක්ස් මගින් දුරකථන මගින් කළ ඉල්ලීමේ ස්ථිර භාවය ලිඛිතව තහවුරු කළ නොහැකි අවස්ථාවකදී නියමිත කාලයට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළෙඳ කටයුතු අංශය වෙත ස්ථිර භාවය තහවුරු කල ලිපිය ගෙනැවිත් භාර දිය යුතුය. ඕනෑම අවස්ථාවක නියමිත කාලය තුළ, ගණුදෙනුව සම්බන්ධ ලිඛිතව තහවුරු කිරීමේ පූර්ණ වගකීම සහභාගිත්ව ආයතනය සතු වේ.

8. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් පිළිබඳ සහභාගිත්ව ආයතන කරනු ලබන ඉල්ලීම් පිළි ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව බැඳී නැති අතර, එය මුළුමනින්ම හෝ නැතිනම් කොටසක් පිළි ගැනීමේ හෝ ප්‍රතික්ෂප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව පවතී.

9. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් සඳහා ඉදිරිපත් කල මුළු මුල්‍ය ඉල්ලුම හෝ එයින් කොටසක් ලබා දීම පිළි ගැනීම සහභාගිත්ව ආයතන මගින් 2 ජේදය යටතේ ලිඛිතව දැනුම් දී ඇති දුරකථන, ෆැක්ස් හෝ ටෙලෙක්ස් අංක මගින් අදල ආයතනයට එදිනම 1400 පැයට කලින් දැනුම් දෙනු ලබන අතර, ආකෘති පත්‍ර 1 සඳහන් පරිදි පිළි ගන්නා ලද ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම ෆැක්ස් මගින් අදළ ආයතනය වෙත යවනු ලැබේ.

10. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් මහ බැංකුව විසින් පිළි ගන්නා ලද අවස්ථාවක අදළ ආයතනය විසින් සිය සුරැකුම්පත් නියමිත පරිදි මහ බැංකුව නමට පිටසන් කර එම සුරැකුම්පත් සමඟ බලය ලත් නිලධාරීන් විසින් නියමිත පරිදි සහතික කරන ලද ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම එදිනම 1500 පැයට කලින් මහ බැංකුව වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

11. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් සඳහා සහභාගිත්ව ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන සුරැකුම්පත්, ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනු සඳහා හුවමාරු කිරීමට පූර්ණ සහ අසීමිත අයිතියක් ඇත. සහභාගිත්ව ආයතනය විසින් ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම් සඳහා අත්සන් කරන විට 2 ජේදය යටතේ මහ බැංකුව වෙත ආදර්ශ අත්සන් සහ නම් ඉදිරිපත් කරන ලද නියමිත පුද්ගලයන් පමණක් අදල ආයතනය වෙනුවෙන් අත්සන් තබා ඇති බව සලකනු ලැබේ.

12. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම සහ පිටසන් කරන ලද සුරැකුම්පත් මහ බැංකුවට ලැබුණු පසු මහ බැංකුවේ ඇති අදළ ආයතනය සතු ගිණුමට ගැණුම් මිලෙහි මුළු වටිනාකම බැර කරනු ලැබේ.

13. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුම මගින් නියම කර ගත් පරිදි ආපසු විකුණන දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති සහභාගිත්ව ආයතනයේ ගිණුමට ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගිවිසුමේ සඳහන් ප්‍රති විකුණුම් වටිනාකම හර කරනු ලැබේ.

14. සහභාගිත්ව ආයතනයේ ගිණුමට, ප්‍රති විකුණුම් දිනයේදී ප්‍රතිවිකුණුම් වටිනාකම හර කිරීමත් සමඟ අවසන් වන ප්‍රතිවර්තන ප්‍රති විකුණුම් ගිවිසුමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගිත්ව ආයතනය නමින් සුරැකුම්පත් පිටසන් කරනු ලබන අතර, සහභාගිත්ව ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩ කරන කාල වේලාවන් තුළදී එවැනි සුරැකුම්පත් ආපසු ලබා ගත යුතුය.

15. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් ඇති වන බැදීමක් බැංකු නිවාඩු දිනයකදී සිදු කිරීමේ තත්ත්වයක් උද්ගත වන අවස්ථාවකදී ඊළඟට එළඹෙන පළමු වැඩ කරන දිනයේදීම එම කටයුත්ත සිදු කරනු ඇත.

16. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවකදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති සහභාගිත්ව ආයතනයේ ගිණුමට අදළ හර සහ බැර කටයුතු කිරීමේ බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

17. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවකදී, ප්‍රති විකුණුම් දිනයේදී, සහභාගිත්ව ආයතනයේ ගිණුමට ප්‍රති විකුණුම් වටිනාකම හර කළහැකි වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති ඔවුන්ගේ ගිණුමක ප්‍රමාණවත් මුදලක් තබා ගැනීමට සහභාගිත්ව ආයතනය වග බලා ගත යුතුය. මෙහි සඳහන් කර ඇති අවශ්‍යතාවන්ට ප්‍රමාණවත් පරිදි අරමුදල් තබා ගැනීමට සහභාගිත්ව ආයතනයක් අසමත් වන අවස්ථාවකදී ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුව, කොන්දේසි විරහිත පූර්ණ මිළදී ගැනීමක් සේ සැලකීමට හැකියාව ලැබෙන අතර, සහභාගිත්ව ආයතනයේ ගිණුම සම්පූර්ණ නොකිරීම තුළින් සිදු වන මූල්‍යමය හානිය මහ බැංකුව සතු ඔවුන්ගේ ගිණුමට හර කරනු ලබන අතර ඊට අමතරව පහත 18 ජේදයේ දක්වා ඇති ක්‍රියාමාර්ගයද ගනු ලැබේ.

18. ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවක නිරත වන අවස්ථාවකදී සහභාගිත්ව ආයතනය මෙහි සඳහන් මෙහෙයුම් උපදෙස් හා පිළිවෙත් අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් එම සහභාගිත්ව ආයතනය ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනුවල යෙදීම අත් හිටවනු ඇත. සහභාගිත්ව ආයතනය ප්‍රාථමික වෙළෙන්දෙකු වන අවස්ථාවකදී ඔහුට එම ප්‍රාථමික වෙළෙන්දකු ලෙස කටයුතු කිරීමට දී ඇති අවසරය අත්හිටුවීමට හෝ අහෝසි කිරීමට හැකිය.

19. මෙහි සඳහන් මෙහෙයුම් පිළිවෙත් හා උපදෙස් කලින් කලට එකතු කිරීමේ හෝ ඉවත් කිරීමේ හෝ වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. එවැනි එකතු කිරීම් හෝ ඉවත් කිරීම් හෝ වෙනස් කිරීම් ක්‍රියාත්මක වන දිනයක් සඳහන් කොට නැති අවස්ථාවක හැර සහභාගිත්ව ආයතනයට එය දැනුම් දුන් අවස්ථාවේ සිට එය ක්‍රියාත්මක වේ.

## අංක බීඩී/04/98 මෙහෙයුම් පිළිවෙත් හා උපදෙස් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් ගණුදෙනු ක්‍රියාත්මක කිරීමට අදාළ අවසරය

ආයතනයේ නම :

ලිපිනය :

දුරකථන අංකය:

ෆැක්ස් අංකය:

| | බලය ලත් නිලධාරියාගේ නම | තනතුර | දුරකථන/ෆැක්ස් අංකය | අත්සන |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |
| 7. | | | | |
| 8. | | | | |
| 9. | | | | |
| 10. | | | | |

ඉහත සඳහන් නිලධාරීන් .................................................................................................................... (ආයතනයේ නම) වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ප්‍රතිවර්තන ප්‍රති මිළදී ගැනීම් සඳහා සහභාගි වීමට බලය ලබා දී ඇති බව සහතික කරමි. කිසියම් වෙනසක් සිදු වුවහොත්, එය වහාම දැනුම් දෙන බවටද සහතික වෙමි.

..................................................

ප්‍රධාන කළමනාකරු

දිනය : .............................

ආකෘති - II

ටෙලිෆෝන් අංක - 422094, 423914
ෆැක්ස් අංක - 421192, 421194, 421195, 421198
ටෙලෙක්ස් අංක - 23505. 23506

විවට වෙළෙඳ කටයුතු අංශය,
බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
30 මහල, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
බටහිර කුළුණ,
ඇචිලන් චතුරශ්‍රය,
කොළඹ 01.

දිනය :

ප්‍රාථමික වෙළෙන්දගේ/වාණිජ බැංකුවේ

නම සහ ලිපිනය : ..........................................................................................................

## ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම
## ගිවිසුම් අංක

පහත සඳහන් කර ඇති විස්තර අනුව ප්‍රති විකිණීම් ගිවිසුම මත ලංකාණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ඔබගෙන් අප මිලදී ගත් බව මෙයින් ස්ථිර කරමු.

| 1. | භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර අංකය | බැඳුම්කර අනුක්‍රමික අංකය* | කල් පිරෙන දිනය | ගැනුම් මිල | විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති ප්‍රමාණය (මතුපිට වටිනාකම) රුපියල් | ගැණුම් වටිනාකම රුපියල් |
|---|---|---|---|---|---|---|
| | ........................ | ........................ | ........................ | ........................ | ................................ | ............................. |
| | ........................ | ........................ | ........................ | ........................ | ................................ | ............................. |
| | | එකතුව | ........................ | ........................ | ................................ | ............................. |

2. ආපසු විකුණන දිනය (කල් පිරෙන දිනය) ..........................................................................

3. කාලය (දින ගණන) ..........................................................................................................

4. පොළී අනුපාතය (%) .......................................................................................................

5. ප්‍රති විකුණුම් වටිනාකම ....................................................................................................

6. පියවීම : අපි අප වෙත ඇති ඔබගේ ගිණුම් අංක ................................... ට මිළදී ගැනීම් දිනයේදී භාණ්ඩාගාර බිල්පත/බිල්පත් හා බැඳුම්කරය/බැඳුම්කර භාර දුන් විට රු. ............................... ක් (මිළදී ගැණුම්වල මුළු වටිනාකම) බැර කරන අතර එම බිල්පත/බිල්පත් බැඳුම්කරය/බැඳුම්කර ආපසු විකිණීම් දිනයේදී, එකී ගිණුමට රු.................................. ක් (ප්‍රතිවිකුණුම් වටිනාකම) හර කරමු.

නියමිත පරිදි අප වෙත පිටසන් කරන ලද ඉහත දක්වෙන භාණ්ඩාගාර බිල්පත/බිල්පත්, බැඳුම්කරය/බැඳුම්කර මිළදී ගන්නා දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත භාර දිය යුතුය. ආපසු විකුණුම් දිනයේදී පිටසන් කර ඒවා ආපසු ඔබ වෙත භාර දෙනු ලැබේ.

.............................................
බලය ලත් නිලධාරී අත්සන
ශ්‍රී ලංකා මහ බැංකුව

.............................................
බලය ලත් නිලධාරී අත්සන
ශ්‍රී ලංකා මහ බැංකුව

එකඟ වෙමු

.............................................
බලය ලත් නිලධාරී අත්සන
ප්‍රාථමික වෙළෙඳකරු/වාණිජ බැංකුව

.............................................
බලය ලත් නිලධාරී අත්සන
ප්‍රාථමික වෙළෙඳකරු/වාණිජ බැංකුව

මුද්‍රාව

කරුණාකර අද දින 1400 පැයට පෙර ෆැක්ස් මගින් තහවුරු කරන්න.

* අදාළ වන තන්හි

මගේ අංකය : බීඩී/එෆ්එෆ්/අයි.ඩී.ඒ/808 ඩී

බැංකු කටයුතු දෙපාර්තමේන්තුව,
විදේශ මුදල් අංශය.
1998 නොවැම්බර් 11 වැනි දින.

මෙහෙයුම් උපදෙස් අංක : බීඩී/5/98

කළමනාකරු,
මහජන බැංකුව,
ආයාත ඒකක 3,
ජාත්‍යන්තර අංශය,
ඒ. එන්. සී. එල්. (ලේක් හවුස්) ගොඩනැගිල්ල,
කොළඹ 10.

මහත්මයාණෙනි,

**ජා.සං.සං. ණය 2938 සීඊ බලශක්ති සේවා සැපයුම් ව්‍යාපෘතිය**

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ගෝලීය පාරිසරික පහසුකම් (ගො.පා.ප.) මගින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කරන ලද උක්ත ණය යටතේ කරනු ලබන ආනයන සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත පහත දක්වේ.

1. කොළඹ 2, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 50 ලංකා විදුලිබල මණ්ඩලයෙහි ව්‍යාපෘති සම්බන්ධතා නිලධාරී වෙනුවෙන් ඔබගේ බැංකුව විසින් ස්ථාපිත කරන ලද සහතික කළ අවලංගු කළ නොහැකි ආධීනතාවයක් නොමැති ණයවර ලිපි මගින් ආනයනයන් සිදු කළ යුතු වේ.

2. ඔබගේ ණයවර ලිපි ආරම්භ කිරීම සඳහා ඔබට බලය පැවරෙන්නේ විදේශ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් විසින් ජා.සං.සං.2938 සීඊ බලශක්ති සේවා සැපයුම් ව්‍යාපෘතිය" නමින් නිකුත් කරනු ලබන ප්‍රතිපාදන ලිපිය මගිනි.

3. මා විසින් වෙනත් උපදෙසක් දී නොමැත්තේ නම් ඔබ විසින් විවෘත කරනු ලබන සෑම ණයවර ලිපියකම ජා.සං.සං. වෙතින් ගණුදෙනුකාර බැංකුව වෙත ප්‍රතිපූරණය ලැබෙනු ඇති බවටත් ණයවර ලිපිය වලංගු වනුයේ ජා.සං.සං. විසින් ගණුදෙනුකාර බැංකුව වෙත සිය විශේෂ බැඳුම්කරය නිකුත් කළ විට පමණක් බවටත් කොන්දේසියක් අඩංගු විය යුතුය.

4. ජා.සං.සං. වෙත විශේෂ බැඳුම්කරයක් සඳහා ඔබ ගණුදෙනුකරු විසින් අයදුම් කිරීම 1931 පෝර්මය (උද්ධෘතයක් අමුණා ඇත) මගින් කළ යුතු වන අතර එය පහත දක්වෙන ලියකියවිලි මගින් තහවුරු විය යුතුය.

   (අ) ගෙවීමට අදාළ කොන්ත්‍රාත්තුවෙහි හෝ මිළදී ගැණුම් අණකරයෙහි පිටපතක් සහ

   (ආ) ඔබ බැංකුව විසින් නිකුත් කිරීමට යෝජනා කරන ණයවර ලිපියෙහි පිටපත් දෙකක්

5. සෑම ණයවර ලිපියක් සඳහා ම කරනු ලැබූ සියළුම සංශෝධනයන්ගේ අනුපිටපත් ජා.සං.සං. ට සැපයීමට ගණුදෙනු කරන බැංකුවට උපදෙස් දිය යුතුය. ජා.සං.සං. විසින් පහත දක්වෙන සංශෝධනයන් සඳහා එහි ලිඛිත අනුමැතිය සපයනු ඇත.

   (අ) ණයවර ලිපියෙහි වටිනාකම

   (ආ) භාණ්ඩවල ප්‍රමාණය හෝ භාණ්ඩ පිළිබඳ විස්තරය

   (ඇ) ප්‍රතිලාභියා සහ

   (ඈ) ණයවර ලිපියෙහි කල් ඉකුත් වන දිනය, මුලින් සඳහන් කරන ලද දිනය හෝ ජා.සං.සං. විසින් නිකුත් කරන ලද විශේෂ බැඳුම්කරයෙහි සඳහන් දිනය හය මසක් ඉක්මවා දීර්ඝ කිරීමක්

   වෙනත් කිසිදු සංශෝධනයක් සඳහා ජා.සං.සං. හි පූර්ව අනුමැතිය අවශ්‍ය නොවේ.

6. උක්ත ණය මාලාව විශේෂ ගැණුම් හිමිකම් මගින් ප්‍රකාශිත බැවින් වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයකින් ප්‍රකාශිත ණයවර ලිපියක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විශේෂ බැඳුම්කර ලිපිය නිකුත් කිරීමේ දී සිය බැඳීම විශේෂ ගැණුම් හිමිකම් මගින් දක්වනු ඇත. මෙම සීමාකරණය හේතුකොටගෙන ජා.සං.සං. මගින් ණයවර ලිපියෙහි සඳහන් මුළු විදේශ මුදල් ප්‍රමාණය විදේශයෙහි සිටින ඔබ නියෝජිතයාට ප්‍රතිපූරණය කරනු නොලබන්නේ නම් මේ සම්බන්ධයෙන් විනිමය පාලක විසින් ඔබ වෙත නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලව ගණුදෙනු කරනු ලබණ බැංකුව වෙත අයවිය යුතු ශේෂය ඔබ විසින් ගෙවිය හැකිය.

7. මෙම ණය ක්‍රමය යටතේ ආනයනකරුවන් නාවික ලියකියවිලි සඳහා වන ලේඛනයන්හි රුපියල් වටිනාකම රජයේ ප්‍රතිපාර්ශවීය අරමුදල් ගිණුමට ගෙවීමට අවශ්‍ය නොවේ. එබැවින්, ඔබ වෙත හෝ ඔබ ගණුදෙනු කරන බැංකුව වෙත අයවිය යුතු කොමිස් අය කිරීම ආදිය වේ නම් ඒවා අයකර ගැනීමෙන් පසු එම ලියකියවිලි ඔබට ලැබුණ වහාම ඔබ ගණුදෙනුකරුවන් වෙත මුද හැරිය යුතුය.

8. ණයවර ලිපි හා සංශෝධන කිසිවක් වේ නම් ඒවායෙහි පිටපත් කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ගණකාධිකාරීගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතුය.

9. මේ සම්බන්ධයෙන් සිය අවශ්‍යතා පිළිබඳව විනිමය පාලක විසින් ඔබ වෙත වෙනම උපදෙස් සපයනු ඇත.

ඔබේ,

විශ්වාසී,

**ඒ. ෂන්මුගසාමි**
*අතිරේක ප්‍රධාන ගණකාධිකාරී*

පිටපත් :

1. විනිමය පාලක
2. ව්‍යාපෘති සම්බන්ධතා නිලධාරී,
   අයිඩීඒ/ඩබ්බී බලශක්ති සේවා සැපයුම් ව්‍යාපෘතිය,
   ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.)
   50, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
   කොළඹ 2.

# වාණිජ බැංකුවලින් විදේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සඳහා මහ බැංකුවේ විනිමය අනුපාතිකයන් 1998

(ශ්‍රී ලංකා රුපියල්)

| ක්‍රියාත්මක වන දිනය | චක්‍රලේඛ අංකය | ඕස්ට්‍රේලියානු ඩොලර් (ඩොලර් 01) | ඔස්ට්‍රියානු ෂිලිං (ෂිලි. 10) | බහරේන් ඩිනාර් (ඩිනාර් 01) | බෙල්ජියානු ෆ්‍රෑන්ක් (ෆ්‍රෑන්ක් 10) | කැනේඩියානු ඩොලර් (ඩොලර් 01) | ඩෙනිෂ් ක්‍රෝනර් (ක්‍රෝ.10) | ඩොයිෂ් මාර්ක් (ඩො.මා.01) | ෆින්ලන්ත මාර්ක්කා (මාර්ක්කා 10) | ප්‍රංශ ෆ්‍රෑන්ක් (ප්‍ර.ෆ්‍රෑන්ක් 10) | හොංකොං ඩොලර් (ඩොලර් 10) | ඉතාලි ලීරා (ලීරා 1000) | ජපාන යෙන් (යෙන් 100) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06.01.98 | 4365 | 38.55 | 47.80 | 157.35 | 16.00 | 41.60 | 86.65 | 33.00 | 105.65 | 98.60 | 76.55 | 33.45 | 44.80 |
| 15.01.98 | 4367 | 38.00 | 47.90 | 157.60 | 15.85 | 41.40 | 85.65 | 32.70 | 105.25 | 97.65 | 76.70 | 33.20 | 44.70 |
| 20.01.98 | 4369 | 39.60 | 47.90 | 157.60 | 15.70 | 41.35 | 85.10 | 32.40 | 104.40 | 96.75 | 76.75 | 33.00 | 46.40 |
| 27.01.98 | 4371 | 39.95 | 47.85 | 157.50 | 16.30 | 40.90 | 88.15 | 33.70 | 106.40 | 100.70 | 76.65 | 33.80 | 47.30 |
| 03.02.98 | 4373 | 40.75 | 48.00 | 158.05 | 15.75 | 41.00 | 85.30 | 32.50 | 104.65 | 96.95 | 77.00 | 33.00 | 47.05 |
| 11.02.98 | 4375 | 40.05 | 48.05 | 158.20 | 15.95 | 41.65 | 86.35 | 32.90 | 106.75 | 98.15 | 77.05 | 33.70 | 47.75 |
| 17.02.98 | 4377 | 40.00 | 48.10 | 158.40 | 15.90 | 41.35 | 86.15 | 32.80 | 105.20 | 97.90 | 77.10 | 33.20 | 47.50 |
| 24.02.98 | 4379 | 39.85 | 48.25 | 158.75 | 15.95 | 42.10 | 86.05 | 32.80 | 105.60 | 97.85 | 77.25 | 33.30 | 46.55 |
| 03.03.98 | 4381 | 40.80 | 48.30 | 158.95 | 16.10 | 42.05 | 86.90 | 33.10 | 106.05 | 98.75 | 77.35 | 33.55 | 47.55 |
| 10.03.98 | 4383 | 40.00 | 48.45 | 159.40 | 15.95 | 42.35 | 86.20 | 32.80 | 105.20 | 97.80 | 77.60 | 33.35 | 46.85 |
| 17.03.98 | 4385 | 40.50 | 48.45 | 159.50 | 16.00 | 42.55 | 86.95 | 33.05 | 105.40 | 98.60 | 77.65 | 33.60 | 46.75 |
| 24.03.98 | 4387 | 40.05 | 46.90 | 160.05 | 16.00 | 42.60 | 86.40 | 32.95 | 105.70 | 98.30 | 77.85 | 33.45 | 46.20 |
| 31.03.98 | 4389 | 40.45 | 47.05 | 160.40 | 16.05 | 42.65 | 86.80 | 33.10 | 106.55 | 98.70 | 78.05 | 33.55 | 46.30 |
| 07.04.98 | 4391 | 40.10 | 46.85 | 161.40 | 16.00 | 42.90 | 86.45 | 33.05 | 105.20 | 98.40 | 78.50 | 33.40 | 45.20 |
| 15.04.98 | 4393 | 40.10 | 47.60 | 161.40 | 16.25 | 42.70 | 87.85 | 33.50 | 106.40 | 99.95 | 78.50 | 33.80 | 46.20 |
| 21.04.98 | 4395 | 39.50 | 47.95 | 161.85 | 16.35 | 42.70 | 88.40 | 33.75 | 108.60 | 100.65 | 78.75 | 34.10 | 46.25 |
| 28.04.98 | 4397 | 39.55 | 48.40 | 162.15 | 16.55 | 42.65 | 89.10 | 34.15 | 109.25 | 101.85 | 78.85 | 34.45 | 46.60 |
| 05.05.98 | 4399 | 39.60 | 48.95 | 162.70 | 16.65 | 42.80 | 89.85 | 34.35 | 109.65 | 102.45 | 79.15 | 34.60 | 46.00 |
| 13.05.98 | 4401 | 39.15 | 49.55 | 163.10 | 16.85 | 42.80 | 91.20 | 34.75 | 111.45 | 103.70 | 79.30 | 35.35 | 46.15 |
| 19.05.98 | 4403 | 38.55 | 49.10 | 163.75 | 16.80 | 42.55 | 90.90 | 34.60 | 111.05 | 103.25 | 79.65 | 35.15 | 45.75 |
| 26.05.98 | 4405 | 38.75 | 50.05 | 164.10 | 17.05 | 42.65 | 92.45 | 35.20 | 112.50 | 104.90 | 79.85 | 35.70 | 45.30 |
| 02.06.98 | 4407 | 38.75 | 49.55 | 164.90 | 16.90 | 42.65 | 91.40 | 34.80 | 111.55 | 103.85 | 80.20 | 35.40 | 44.80 |
| 10.06.98 | 4409 | 37.20 | 49.80 | 165.05 | 16.95 | 42.60 | 91.90 | 34.95 | 112.50 | 104.30 | 80.30 | 35.60 | 44.25 |
| 16.06.98 | 4411 | 36.65 | 49.00 | 165.40 | 16.70 | 42.45 | 90.60 | 34.50 | 110.40 | 102.90 | 80.60 | 35.05 | 43.00 |
| 23.06.98 | 4413 | 37.95 | 49.60 | 165.40 | 16.85 | 42.40 | 91.40 | 34.80 | 111.90 | 103.65 | 80.55 | 35.45 | 45.40 |
| 30.06.98 | 4415 | 37.75 | 49.05 | 166.05 | 16.80 | 42.60 | 90.65 | 34.60 | 111.40 | 103.30 | 80.75 | 35.05 | 44.10 |
| 08.07.98 | 4417 | 38.60 | 49.15 | 166.65 | 16.75 | 42.75 | 90.60 | 34.55 | 110.80 | 103.05 | 81.05 | 35.05 | 44.75 |
| 14.07.98 | 4419 | 38.20 | 49.20 | 167.00 | 16.90 | 42.60 | 91.15 | 34.80 | 110.45 | 103.80 | 81.25 | 35.10 | 44.15 |
| 21.07.98 | 4421 | 39.55 | 50.15 | 167.15 | 17.20 | 42.35 | 92.90 | 35.45 | 112.95 | 105.70 | 81.30 | 35.70 | 45.25 |
| 27.07.98 | 4423 | 38.90 | 50.60 | 167.75 | 17.25 | 42.10 | 93.30 | 35.55 | 113.55 | 106.05 | 81.60 | 36.05 | 44.60 |
| 04.08.98 | 4425 | 38.65 | 50.95 | 168.55 | 17.35 | 41.95 | 93.85 | 35.75 | 114.15 | 106.70 | 82.00 | 36.10 | 43.90 |
| 11.08.98 | 4427 | 38.20 | 51.10 | 169.00 | 17.35 | 41.90 | 94.30 | 35.80 | 115.15 | 106.75 | 82.20 | 36.45 | 43.60 |
| 18.08.98 | 4429 | 37.80 | 50.85 | 169.45 | 17.20 | 42.10 | 93.30 | 35.50 | 114.30 | 105.95 | 82.40 | 36.20 | 43.70 |
| 25.08.98 | 4431 | 37.00 | 50.50 | 169.40 | 17.20 | 41.35 | 93.00 | 35.40 | 113.75 | 105.75 | 82.40 | 36.00 | 44.10 |
| 01.09.98 | 4433 | 36.20 | 51.70 | 169.25 | 17.45 | 40.95 | 93.05 | 36.50 | 114.00 | 108.80 | 82.35 | 36.35 | 45.05 |
| 08.09.98 | 4435 | 37.60 | 52.45 | 169.05 | 17.90 | 41.90 | 96.75 | 36.90 | 117.00 | 109.90 | 82.25 | 37.25 | 48.10 |
| 15.09.98 | 4437 | 38.10 | 53.70 | 169.20 | 18.20 | 42.05 | 98.60 | 37.55 | 120.55 | 111.95 | 82.30 | 38.25 | 48.20 |
| 22.09.98 | 4439 | 37.45 | 53.65 | 169.40 | 18.30 | 41.95 | 99.20 | 37.75 | 120.65 | 112.55 | 82.40 | 38.20 | 47.95 |
| 29.09.98 | 4441 | 37.60 | 54.05 | 169.55 | 18.55 | 42.25 | 100.45 | 38.20 | 122.45 | 113.90 | 82.50 | 38.75 | 47.10 |
| 07.10.98 | 4443 | 37.60 | 55.50 | 169.55 | 18.95 | 41.00 | 103.00 | 39.15 | 124.60 | 116.80 | 82.50 | 39.55 | 47.85 |
| 13.10.98 | 4445 | 39.90 | 56.50 | 169.30 | 18.95 | 41.50 | 102.30 | 38.90 | 124.95 | 116.05 | 82.40 | 39.50 | 54.95 |
| 21.10.98 | 4447 | 40.50 | 56.65 | 169.70 | 18.95 | 41.35 | 103.10 | 39.15 | 126.55 | 116.80 | 82.55 | 39.70 | 55.65 |
| 27.10.98 | 4449 | 39.70 | 56.85 | 170.30 | 18.95 | 41.55 | 102.75 | 39.10 | 125.25 | 116.50 | 82.85 | 39.65 | 54.15 |
| 04.11.98 | 4451 | 40.25 | 56.90 | 170.45 | 18.85 | 41.65 | 102.30 | 38.90 | 124.30 | 116.10 | 82.95 | 39.25 | 56.00 |
| 10.11.98 | 4453 | 40.90 | 57.10 | 171.05 | 18.70 | 42.00 | 101.10 | 38.45 | 124.20 | 114.65 | 83.25 | 39.20 | 54.00 |
| 17.11.98 | 4455 | 41.15 | 57.25 | 171.40 | 18.50 | 41.70 | 101.20 | 38.50 | 122.65 | 114.85 | 83.45 | 38.65 | 52.80 |
| 24.11.98 | 4457 | 41.55 | 54.45 | 171.95 | 18.55 | 41.95 | 100.70 | 38.30 | 123.00 | 114.25 | 83.75 | 38.80 | 53.90 |
| 01.12.98 | 4459 | 41.20 | 54.10 | 172.70 | 18.45 | 42.40 | 100.05 | 38.05 | 122.20 | 113.50 | 84.10 | 38.50 | 52.65 |
| 08.12.98 | 4461 | 40.10 | 55.20 | 172.75 | 18.85 | 42.40 | 102.20 | 38.85 | 124.90 | 115.90 | 84.05 | 39.25 | 54.75 |
| 15.12.98 | 4463 | 40.20 | 56.25 | 172.75 | 19.15 | 42.25 | 104.00 | 39.55 | 126.20 | 118.00 | 84.05 | 39.80 | 55.85 |
| 22.12.98 | 4465 | 40.40 | 55.85 | 173.00 | 19.00 | 42.15 | 103.30 | 39.30 | 125.75 | 117.25 | 84.20 | 39.55 | 56.70 |
| 29.12.98 | 4467 | 39.70 | 55.30 | 173.65 | 18.90 | 42.25 | 102.30 | 38.90 | 125.45 | 115.90 | 84.50 | 39.35 | 55.95 |

| ක්‍රියාත්මක වන දිනය | කුවේට් ඩිනාර් (ඩිනාර් 01) | මැලේසියානු රින්ගිට් (රින්ගිට් 10) (අ) | නෙදර්ලන්ත ගිල්ඩර් (ගිල් 01) | නෝර්වීජියානු ක්‍රෝනර් (ක්‍රෝ.10) | ඕමාන් රියාල් (රියාල් 01) | සෞදි අරාබියානු රියාල් (රියාල් 01) | සිංගප්පූරු ඩොලර් (ඩොලර් 01) | ස්වීඩන් ක්‍රෝනර් (ක්‍රෝ.10) | ස්විස් ෆ්‍රෑන්ක් (ෆ්‍රෑන්ක් 01) | එක්සත් අරාබි එමීර් ඩිරාම් (ඩිරාම් 01) | එ.රා.පවුම (පවුම 01) | ඇ.එ.ජ.ඩොලර් (ඩොලර් 01) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06.01.98 | 189.15 | 14.75 | 29.25 | 80.65 | 149.95 | 15.80 | 34.80 | 74.55 | 40.60 | 16.15 | 97.50 | 59.85 |
| 15.01.98 | 188.70 | 12.80 | 29.00 | 78.95 | 150.15 | 15.85 | 33.15 | 73.85 | 40.30 | 16.20 | 96.55 | 59.95 |
| 20.01.98 | 188.70 | 14.20 | 28.75 | 78.60 | 150.15 | 15.85 | 34.25 | 73.80 | 39.70 | 16.20 | 97.25 | 59.95 |
| 27.01.98 | 189.20 | 13.30 | 29.90 | 80.75 | 150.05 | 15.85 | 33.85 | 75.90 | 41.60 | 16.15 | 99.80 | 55.90 |
| 03.02.98 | 189.90 | 14.35 | 28.80 | 78.35 | 150.60 | 15.90 | 34.75 | 73.10 | 40.20 | 16.20 | 97.20 | 60.15 |
| 11.02.98 | 190.20 | 15.55 | 29.20 | 79.00 | 150.75 | 15.90 | 35.85 | 69.35 | 40.80 | 16.25 | 97.85 | 60.20 |
| 17.02.98 | 190.55 | 15.05 | 29.10 | 78.90 | 150.95 | 15.90 | 35.55 | 73.75 | 40.80 | 16.25 | 97.95 | 60.25 |
| 24.02.98 | 191.00 | 15.65 | 29.10 | 78.65 | 151.30 | 15.95 | 36.10 | 73.90 | 40.55 | 16.30 | 97.85 | 60.40 |
| 03.03.98 | 191.20 | 16.45 | 29.40 | 79.30 | 151.45 | 15.95 | 36.95 | 75.10 | 40.95 | 16.30 | 98.75 | 60.45 |
| 10.03.98 | 191.75 | 14.85 | 29.10 | 79.05 | 151.90 | 16.00 | 36.20 | 74.75 | 40.30 | 16.35 | 98.35 | 60.65 |
| 17.03.98 | 191.45 | 16.05 | 29.30 | 79.65 | 151.95 | 16.05 | 37.55 | 75.90 | 40.65 | 16.35 | 100.40 | 60.70 |
| 24.03.98 | 192.10 | 16.70 | 29.25 | 79.45 | 152.50 | 16.10 | 37.60 | 75.80 | 40.25 | 16.45 | 100.65 | 60.90 |
| 31.03.98 | 192.50 | 16.90 | 29.35 | 80.30 | 152.80 | 16.10 | 38.00 | 76.80 | 40.40 | 16.45 | 101.65 | 61.00 |
| 07.04.98 | 193.75 | 16.25 | 29.30 | 79.60 | 153.80 | 16.20 | 37.50 | 76.10 | 40.00 | 16.55 | 100.85 | 61.40 |
| 15.04.98 | 193.65 | 16.60 | 29.75 | 80.75 | 153.75 | 16.20 | 38.10 | 77.30 | 40.25 | 16.55 | 101.80 | 61.40 |
| 21.04.98 | 194.25 | 16.05 | 29.95 | 81.15 | 154.20 | 16.25 | 38.00 | 78.50 | 40.70 | 16.60 | 102.75 | 61.60 |
| 28.04.98 | 194.80 | 16.20 | 30.35 | 81.70 | 154.50 | 16.30 | 38.35 | 79.15 | 40.95 | 16.65 | 101.95 | 61.70 |
| 05.05.98 | 195.40 | 16.70 | 30.50 | 82.65 | 155.00 | 16.35 | 38.60 | 79.35 | 41.10 | 16.70 | 102.10 | 61.90 |
| 13.05.98 | 196.00 | 15.90 | 30.85 | 83.15 | 155.35 | 16.40 | 37.75 | 80.60 | 41.75 | 16.75 | 101.30 | 62.05 |
| 19.05.98 | 196.85 | 16.30 | 30.70 | 82.50 | 156.05 | 16.45 | 37.30 | 79.80 | 41.55 | 16.80 | 100.10 | 62.30 |
| 26.05.98 | 196.60 | 16.30 | 31.20 | 83.55 | 156.35 | 16.50 | 37.65 | 80.60 | 42.20 | 16.85 | 101.00 | 62.45 |
| 02.06.98 | 197.80 | 16.10 | 30.90 | 82.35 | 157.15 | 16.55 | 36.90 | 79.20 | 41.85 | 16.95 | 101.20 | 62.75 |
| 10.06.98 | 198.00 | 15.45 | 31.05 | 83.30 | 157.30 | 16.60 | 36.25 | 79.30 | 41.05 | 16.95 | 101.50 | 62.80 |
| 16.06.98 | 197.90 | 15.45 | 30.60 | 81.35 | 157.65 | 16.60 | 35.65 | 77.80 | 41.55 | 17.00 | 101.75 | 62.90 |
| 23.06.98 | 197.40 | 15.80 | 30.85 | 82.35 | 157.65 | 16.60 | 37.95 | 78.65 | 41.65 | 17.00 | 103.65 | 62.95 |
| 30.06.98 | 198.15 | 15.45 | 30.70 | 81.40 | 158.25 | 16.70 | 37.25 | 78.30 | 41.05 | 17.05 | 104.15 | 63.15 |
| 08.07.98 | 198.85 | 15.00 | 30.65 | 80.80 | 158.80 | 16.75 | 36.75 | 77.55 | 41.00 | 17.10 | 103.30 | 63.40 |
| 14.07.98 | 199.30 | 14.75 | 30.85 | 81.90 | 159.15 | 16.80 | 36.30 | 78.20 | 41.20 | 17.15 | 102.80 | 63.55 |
| 21.07.98 | 199.70 | 15.20 | 31.45 | 83.90 | 159.30 | 16.80 | 36.95 | 79.70 | 42.00 | 17.15 | 103.70 | 63.60 |
| 27.07.98 | 200.35 | 15.25 | 31.55 | 83.95 | 159.85 | 16.85 | 36.80 | 80.20 | 42.30 | 17.25 | 104.80 | 63.80 |
| 04.08.98 | 201.30 | 15.30 | 31.70 | 84.25 | 160.60 | 16.95 | 36.75 | 80.05 | 42.65 | 17.30 | 103.80 | 64.10 |
| 11.08.98 | 202.15 | 15.15 | 31.75 | 84.10 | 161.05 | 17.00 | 36.30 | 79.70 | 42.55 | 17.35 | 103.75 | 64.30 |
| 18.08.98 | 202.50 | 15.20 | 31.50 | 83.50 | 161.45 | 17.05 | 36.45 | 78.20 | 42.40 | 17.40 | 103.25 | 64.45 |
| 25.08.98 | 202.45 | 15.15 | 31.40 | 82.60 | 161.45 | 17.00 | 36.10 | 78.00 | 42.45 | 17.40 | 104.40 | 64.45 |
| 01.09.98 | 202.25 | 15.10 | 32.35 | 77.05 | 161.25 | 16.95 | 35.90 | 76.75 | 44.55 | 17.35 | 107.00 | 64.35 |
| 08.09.98 | 202.05 | | 32.70 | 82.95 | 161.10 | 17.00 | 36.75 | 80.55 | 44.95 | 17.35 | 106.45 | 64.30 |
| 15.09.98 | 203.95 | | 33.30 | 84.60 | 161.25 | 17.00 | 36.75 | 80.60 | 45.65 | 17.35 | 106.65 | 64.40 |
| 22.09.98 | 204.15 | | 33.45 | 85.65 | 161.40 | 17.05 | 36.85 | 81.45 | 45.85 | 17.40 | 107.15 | 64.45 |
| 29.09.98 | 204.55 | | 33.85 | 86.35 | 161.55 | 17.05 | 37.75 | 80.90 | 46.30 | 17.40 | 108.70 | 64.50 |
| 07.10.98 | 204.55 | | 34.75 | 85.45 | 161.55 | 17.05 | 38.05 | 79.70 | 47.60 | 17.40 | 107.55 | 64.50 |
| 13.10.98 | 204.25 | | 34.50 | 84.95 | 161.30 | 17.00 | 39.00 | 80.15 | 48.15 | 17.40 | 108.30 | 64.40 |
| 21.10.98 | 204.75 | | 34.70 | 85.90 | 161.70 | 17.05 | 39.35 | 82.20 | 48.15 | 17.40 | 108.70 | 64.55 |
| 27.10.98 | 205.45 | | 34.65 | 87.45 | 162.25 | 17.10 | 39.50 | 83.80 | 47.65 | 17.50 | 108.05 | 64.80 |
| 04.11.98 | 205.60 | | 34.50 | 87.95 | 162.40 | 17.15 | 39.70 | 82.80 | 47.65 | 17.50 | 107.55 | 64.85 |
| 10.11.98 | 206.35 | | 34.15 | 86.90 | 163.00 | 17.20 | 39.25 | 82.05 | 46.60 | 17.55 | 106.80 | 65.10 |
| 17.11.98 | 206.80 | | 33.90 | 86.55 | 163.35 | 17.25 | 39.15 | 79.85 | 46.65 | 17.60 | 107.70 | 65.20 |
| 24.11.98 | 207.45 | | 33.95 | 86.60 | 163.85 | 17.30 | 39.70 | 80.25 | 46.50 | 17.65 | 107.40 | 65.45 |
| 01.12.98 | 209.05 | | 33.75 | 86.20 | 164.60 | 17.35 | 39.35 | 79.70 | 46.15 | 17.75 | 107.60 | 65.70 |
| 08.12.98 | 208.80 | | 34.45 | 87.55 | 164.60 | 17.35 | 39.25 | 80.50 | 47.50 | 17.75 | 108.15 | 65.70 |
| 15.12.98 | 208.85 | | 35.10 | 85.40 | 164.60 | 17.35 | 39.55 | 81.25 | 49.10 | 17.75 | 109.90 | 65.75 |
| 22.12.98 | 210.50 | | 34.90 | 84.75 | 164.85 | 17.40 | 39.60 | 81.30 | 48.55 | 17.75 | 109.85 | 65.80 |
| 29.12.98 | 211.30 | | 34.50 | 85.80 | 165.45 | 17.45 | 39.40 | 81.20 | 47.65 | 17.80 | 109.40 | 66.05 |

(අ) නගාරා බැංකුවේ 501/1 අංක දරන චක්‍රලේඛයට අනුව 1998 සැප්තැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැලේසියානු රින්ජිට් මුදල් මිලට ගැනීම අත්හිටවන ලදි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව